**ස්විට්සර්ලන්ත ෆෙඩරල් කවුන්සිලය**

**හා**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව**

**අතර**

**සංක්‍රමණික හවුල්කාරිත්වයක් ස්ථාපනය කිරීම පිළිබඳ**

**අවබෝධතා ගිවිසුම**

මින්මතුවට "අත්සන්කරුවන් " ලෙස හැඳින්වෙන ස්විට්සර්ලන්ත ෆෙඩරල් කවුන්සිලය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව;

2016 ඔක්තෝබර් මස 4 වැනි දින අත්සන් තබන ලද සංක්‍රමණික ගැටලු පිළිබඳ ස්විට්සර්ලන්තෆෙඩරල් කවුන්සිලයහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර සහයෝගීතා ගිවිසුම සිහිපත්කරමින්;

අත්සන්කරුවන් පාර්ශ්වකරුවන් වන සංක්‍රමණික හා සංවර්ධන ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර බහුපාර්ශ්වීය ගිවිසුම් පවත්වා ගෙන යාමට වෙරදරමින්;

ප්‍රජාතාන්ත්‍රවාදි මූලධර්ම හා නීතියේ ආධිපත්‍ය පවත්වාගෙන යාමට වෙරදරමින් හා විශ්වීය මානව හිමිකම් ප්‍රකාශය හා වෙනත් අදාළ ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම්වල දක්වා ඇති පරිදි, මානව හිමිකම් හා මූලික නිදහසට ගරු කිරීමට ඇපකැප වෙමින්;

සාකල්‍ය හා විස්තීර්ණ ප්‍රවේශයක් තුළ වටහාගත යුතු සංක්‍රමණය සඳහාඅවශ්‍යතාවයන්, තිරසර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රය තුලින් පිළිබිඹු කළ පරිදි සංක්‍රමණය හා සංවර්ධනය අතර සබඳතාවය පිළිබඳසවිඥානක වෙමින්;

අන්‍යොන්‍ය ක්‍රියාකාරීත්ව මූලධර්මය මත පදනම්ව, සංක්‍රමණික ක්ෂේත්‍රයන්ගේ ස්වකීය කතිකාවත හා සහයෝගීතාවය ශක්තිමත් කර පුළුල් කිරීමටත් එමගින් ලැබෙන අවස්ථා හඳුනා ගැනීමටත්, ගෝලීය සංක්‍රමණය පිළිබඳ අභියෝග සඳහා සංක්‍රමණික සාධනීය විසඳුම් සොයාගැනීම මේ අභිලාෂයෙන්;

අක්‍රමවත් සංක්‍රමණවල වල අයහපත් ප්‍රතිඵල මර්දනය කිරීම සඳහා සම්භාවය ලද රටේ, ගමනාන්තයේ හා සංක්‍රාන්තියේ යෙදෙන රටේ අවශ්‍යතා මෙන්ම සංක්‍රමණිකයන්ගේ අවශ්‍යතා හා හිමිකම් සැලකිල්ලට ගන්නා සංක්‍රමණික ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාමට තීරණය කරමින්;

සංක්‍රමික හවුල්කාරිත්වයක් තුළින් තම තමාගේ සහයෝගීතාව වැඩිදියුණු කිරිම සඳහා මෙසේ අවබෝධතාවයකට එළඹ තිබේ.

ක්‍රමවත් හා අඛණ්ඩ සංවාදයක් හාවිශේෂයෙන් පහත ලැයිස්තුගත කොට ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් දෙරටටම වාසි ගෙන දෙන සංක්‍රමනික කටයුතු පිළිබඳව පොදු ක්‍රියාවලියක් ස්ථාපනය කිරීමට ඇති ඉඩකඩ පිළිබඳව සලකා බැලීමට අත්සන්කරුවන්ගේ අපේක්ෂාව වෙයි:

- සංක්‍රමණිකයන්ගේගලනයන්කළමනාකරණ කිරීම.
- අක්‍රමවත් සංක්‍රමණ වැළැක්වීම.
- තම ජාතිකයන්, රටක් හිමි නොමැති පුද්ගලයන් හා තුන්වැනි රටක ජාතිකයන් නැවත භාර ගැනීම.
- ආපසු ඒමට සහාය ලබා දීම හා නැවත සමෝධානීකරණය.
- සංක්‍රමණික පාලන ක්‍රම කටයුතු පිළිබඳධාරිතා සංවර්දනය.
- සංක්‍රමණිකයන් නීති විරෝධී ලෙසප්‍රවාහනය කිරීම වැළැක්වීම,මිනිස් ජවාරමට එරෙහිව කටයුතු කිරීම.

- වීසා බලපත් පිළිබඳ ගැටලු , කොන්සියුලර් හා ඊට අදාළ පරිපාලන කටයුතු.
- වෘත්තීය පුහුණුව.
- සියලුම මට්ටම් පිළිබඳ පූර්ණ වශයෙන් කටයුතුවල නියලීමක් තුළින් තිරසාර සංවර්ධනය සඳහා ආරක්ෂිත හා ක්‍රමවත්ව සංක්‍රමණයක් ප්‍රවර්ධනය කිරීම.
- විදේශිකයන් ශ්‍රී ලංකාවේ සිදුකර ඇති ආයෝජන සඳහා රාමුගත කොන්දේසි ශක්තිමත් කිරීම.
- සමෝධානිකරණය.
- නීතියේ ආධිපත්‍ය හා සංහිදියාව ප්‍රවර්ධනය කරන ව්‍යාපෘති.

මෙම අවබෝධතා ගිවිසුමේ විස්තර කොට ඇති සංක්‍රමණික හවුල්කාරීත්වය ක්‍රියාත්මක කිරීම, අවශ්‍යවුවහොත්ද්විපාර්ශවික උපදේශනය සඳහායාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම තුළි , ස්විට්සර්ලන්ත ෆෙඩරල් කවුන්සිලය වෙනුවෙන් අධිකරණ හා පොලිස් ෆෙඩරල් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවේ විදේශ කටයුතු අමාත්‍යංශය විසින් අධීක්ෂණය කරනු ලබයි.

මෙම අවබෝධතා ගිවිසුමේ විධිවිධාන මගින්, අත්සන් කරුවන් අතර කිසිදු නෛතික හිමිකමක් හෝ බැඳීමක් හෝ ඇති නොකරයි.

ජර්මන්, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් දෙපිටපතකින් යුතුව සාදා 2018 අගෝස්තු 06 දින වන මෙදින කොළඹ දී මීට අත්සන් තබන ලදී. අර්ථකථනයේ යම් අපසාරීතාවක් වෙතොත් ඉංග්‍රීසි පිටපත වළංගුව පැවතිය යුතුය.

| | |
|---|---|
| | ශ්‍රී ලංකා |
| ස්විට්සර්ලන්ත ෆෙඩරල් | ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී |
| කවුන්සිලය වෙනුවට | ජනරජය ආණ්ඩුවවෙනුවට |